# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2129/47 – 2019 ජුනි 25 වැනි අඟහරුවාදා – 2019.06.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 අප්‍රේල් මස 26 දින අංක 1807/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2013 අංක 109 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/20.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
WGSWD&EIP/ACQ/KB/05.
2019 ජුනි මස 18 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535 බී, දිවුලපිටිය බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, පැපිලියාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො 9569 හා 2019.05.05 දිනැති සංශෝධිත මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ පහත සඳහන් ඉඩම් කොටස් 02 සඳහා මායිම්:

01. **කැබලි අංක 28 – දිවුලපිටිය පාරේ වරි. අංක 56/1 දරන ඉඩමේ කොටසක් – ප්‍රමාණය: හෙක්. 0.0651**

උතුරට: කැබලි අංක 27 සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ කැබලි අංක 30; දකුණට: කැබලි අංක 30, 29 සහ දිවුලපිටිය පාරේ වරි. අංක 56/1 දරන ඉඩම; බටහිරට: කැබලි අංක 29, දිවුලපිටිය පාරේ වරි. අංක 56/1 දරන ඉඩම සහ කැබලි අංක 27.

02. **කැබලි අංක 29 – දිවුලපිටිය පාරේ වරි. අංක 56/1 දරන ඉඩමේ කොටසක් – ප්‍රමාණය: හෙක්. 0.0008**

උතුරට: කැබලි අංක 27 සහ 28; නැගෙනහිරට: කැබලි අංක 28 සහ 30; දකුණට: කැබලි අංක 36, පාර සහ දිවුලපිටිය පාරේ වරි. අංක 56/1 දරන ඉඩම; බටහිරට: දිවුලපිටිය පාරේ වරි. අංක 56/1 දරන ඉඩම සහ කැබලි අංක 27.

07 - 281